# දැදුරු ඔය බඩ ගැටවර විශ්‍රාන්තිය

ඒ.එම්.එස්.ජේ.පී. අබේකෝන්

''වන්නිකරණයට අයත් දැදුරු ඔය බඩ සිංහලයන්ගේ ජීවිතය පන්සලක් වටා ගෙතුණු අල්පේච්ඡ ජීවන රටාවක් අනුව සකස් වූවකි. තාක්‍ෂණය, නවීකරණය, නාගරීකරණය වැනි සමකාලීන සමාජ බලවේග හමුවෙහි දැදුරු ඔයබඩ ගැමිරොද තමන්ට ආවේණික පාරම්පරික සිරිත් විරිත් දෙදරා යන සැටි සංවේගයෙන් බලා සිටිති.'' පාරම්පරික සමාජ ක්‍රමයේ විපරිණාමය පිළිබඳ වෘත්තාන්තයේ එක් පැතිකඩක් ගැටවරයන් කිහිපදෙනෙකුගේ ජීවිත අළලා විස්තර කිරීම ''කැදැල්ලේ කුරුල්ලෝ'' නම් මේ නිර්මාණයේ කර්තෘ වූ ස්වර්ණ ශ්‍රී බණ්ඩාරයන්ගේ අරමුණ වේ. පිටු 168 කින් යුක්ත වූ මෙම නිර්මාණය තුලින් දැදුරු ඔය බඩ ගැමි දරුවන්ගේ විශ්‍රාන්තිය මනාව ගම්‍ය වේ.

දෙන්නාටම එකතු වෙලා ඔළිඳ දමත හැකි ..... කඩපිලට වී දාං ඇද ඔහු ගෙදර යන්නේ රෑ වීය.... තුන් කුදු ගැහී බුරුත කවිච්චිය මත පෙරලෙමින්, පිනුම් ගසමින් සුජුල මේ සියල්ලෙන් විනෝද වූයේය.... සියඹලා ඇටවලින් මළු හදමින් සිටි සුජල ඒ හඬ ආ දෙසට දුව ගියේය.... මුළු ඇඟම සීත වතුරේ පොඟවා නාන එක කොච්චර සන්තෝෂයක් ද ? කමතේදී නොතිබුණු සතුට ඇළේ දී භුක්ති විඳගත හැක.... ඒ නාන විට ඔවුහු දියබුං ගසති. එකිනෙකාට දිය ඉසා ගනිති. දියඹට පීනති. වීරා දිය යටින් පීනයි. දියේ පිනුම් ගසයි. ඇළ ඉවුරේ සිට 'ජබොං'' ගා ඇළට පැනීමට ඔවුහු කවුරුත් ප්‍රිය කළෝය. සමහර විට තරඟයට දියට පැන්නෝය.... එහෙම රංචුව ගැහිලා නාන්ට ඇත්නම් සැබෑ සන්තෝෂය ...... ඉස්කෝලෙදි එකට ඉගෙනගත් ඔවුහු එකට සෙල්ලම් කළෝය. දළ කළෝය. ''බිංකුණ්ඩෝ .... බිංකුණ්ඩෝ .... තෝත් නටාපිය - මාත් නටන්නම්'' සුනිල් කවියේ තාලයට ඇඟපත නැටෙව්වේය. ''චක්ගුඩු තෙයියත් - කොණ්ඩ කුරුල්ලන් .... හැම තැනම, පුංචි කටෙන් කියැවෙන පුංචි පුංචි සෙල්ලම් කවි .... වීරා යනවිට පන්දු රකිමින් හිටියේ අනෙක් පිලය.... පොල් කෝම්බ මත ඉන්දවා ගත් සුනිල්ට හැමෝම ජල්ලි කීවෝය..... සෙල්ලම අහවර වන විටත් ආයෙත් සෙල්ලම පටන් ගන්නා විටත් හැමෝම ඒක කළේය..... ඔවුහු එකතු වී සරුංගල් තැනුවෝය..... වීරා ඉරටු කපා සුද්ද කර සරුංගලය බැන්දේය..... වීරාත් ටිකිරීත් සරුංගලය උස්සාගෙන වෙල දිහාට ගියෝය. නූල් පන්ද අතට ගත් සජුල ඒ පස්සෙන් දිව්වේය. ගේ පල්ලෙහා වෙල්යායට සරුංගලය උත්සාගෙන යන විට ඈත හිටන් කොල්ලො කුරුට්ටෝ රංචුවක් මැතට දුවගෙන ආවෝය. සමහර කොල්ලෝ සරුංගලය අත ගෑවෝය. පුංචි කොල්ලෝ රැලි අත ගෑවෝය.... ඉදුණු අඹයක් කඩාගෙන සරමේ කැටිකරගත් වීරා ගඟෙන් බසින ගමනේ කීවේය.... වීරා අඹ ගෙඩියක් කඩාගෙන හරි බරි ගැහී අඹ අත්තේ උඩ වාඩිගත්තේය. ටිකිරි අප්පෝ කජු අහුලන්ට යන්නේ, වීරගහ ලන්දට .... නෙළන දවස්වල චූටි කුමාරිහැමි නියටට විට ඉඳන් කවි කියලා තියෙන්නෙ කජු ඇට පොරොන්දුවට. ගෑණුන්ගේ අවුරුදු ඇඳුම්වල, මැහුම් ලේන්සුවල මල් මහලා කජු ඇට අරන්.... ඉතින් වීරාට කූඩුවක් හදන්න පුළුවන් නොවැ.... බට පතුරු රැස්සේය. කට්ට කැපුවේය. මුළු එක තැන් කර ගැට ගසා රාමු සැදුවේය. රාමු එකට තියා කූඩුව සාදා නිමකලේ වීරාය.... කූඩුවක් සාදා අහවර වෙන විට ඉස්පාසුව සන්තෝසය ඉහවහා ගිහින්ය.... ටිකිරිලා වෙසක් බලන්න යනවද ? ..... පැටවු විසි දෙනෙකුත් එක්ක කූඩුව සාදා ඉවරය. පුවක් ගස් බඩ කෑවෝය. හොර පොල් හොර පුවක් කැඩුවෝය. ඒවා කඩයට දී බීඩි ගත්තෝය... ඒවා ගල උඩ වී හොරෙන් බීවෝය..... උදේ කැලයට යන වීරා ගෙදර එන්නේ සවස් වීය. පොත් කියවා නලා පිඹ හරක් ද මේච්චල් කරගෙන වීරා ගෙදර එන්නේ ඉණ ද පුරවා ගෙනය..... වීරා ලන්දට හරක් මේච්චලේට ගොහින් එනකොට එයාට කුරුළු පිහාටු ඇන්න ඇවිත් දෙනවයි කියලා .... ඒකා අවුරුදු උත්සවය දා ලෙස්සන ගහේ නැග්ගා. වීරා උස් හඬෙන් සිනාසුනේය.

මේ අනුව ගැමි දරුවන්ගේ කෙළිදෙලෙන් ගත කරන්නා වූ සුන්දරත්වය තුල පවතින විශ්‍රාන්තිමය ස්වභාවය මනාව අධ්‍යයනයට මෙම කෘතිය පෙරවදනක් වනු නොඅනුමානය.

ස්වර්ණ ශ්‍රී බණ්ඩාර, කැදැල්ලේ කුරුල්ලෝ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද එස්. කුලරත්න මාවත, කොළඹ 10.